# කෙමිකල් පීලින් ප්‍රතිකාරය

# (Chemical Peeling)

## (1) පීලින් ප්‍රතිකාරය යනු කුමක්ද?

කෙමිකල් පීලින් ප්‍රතිකාරය යනු විවිධ සාන්ද්‍රණයන්ගෙන් යුත් අම්ල පාලනයක් සහිතව සමේ ආලේපනය කර, සමේ පවතින විවිධ තත්ත්වයන්ට කරනු ලබන ප්‍රතිකාරයයි.

සමේ දුර්වර්ණ වීම, කළු පැහැ ගැනීම, සියුම් රැලිවැටීම, කුරුලෑ අධික තෙල් සහිත සම පීලින් ප්‍රතිකාරය මගින් සාර්ථකව ප්‍රතිකාර කළ හැකි තත්ත්වයන්ගෙන් සමහරකි.

## (2) පීලින් ප්‍රතිකාරයේදී සිදුවන්නේ කුමක්ද?

ආම්ලික ද්‍රාවණයක් (Acids) ආලේප කිරීමේදී, සමේ මතුපිට පවතින රෝගී **සෛල** ස්ථර ගැලවී යයි. මෙහිදී පහළ ස්ථර වල පවතින වඩා නිරෝගී සෛලවලට වැඩීමට ඉඩ ලබාදීමෙන්, ඔබේ සම නිරෝගී පැහැපත් දීප්තිමත් සමක් බවට පත්වෙයි.

## (3) පීලින් වර්ග මොනවාද?

මෙම ප්‍රතිකාරය එය ක්‍රියාකාරී වන සමෙහි ගැඹුර අනුව වර්ග 03 කට බෙදා ඇත.

- මතුපිට පීලින් ප්‍රතිකාර (superficial peeling)
  මෙහිදී අම්ලය ගමන් කරනු ලබන්නේ අපිචර්මයේ ඉහළම පවතින ස්ථර කිහිපයකට පමණි.

- මධ්‍යම පීලින් ප්‍රතිකාරය (medium depth peeling)
  මෙහිදී අම්ලය සම්පූර්ණ අපිචර්මයේ හා චර්මයේ ඉහළම කොටසේ දී ක්‍රියාකාරී වේ.

- වඩා ගැඹුරු පීලින් ප්‍රතිකාරය (deep peeling)
  මෙහිදී අම්ලය චර්මයේ පහළ කොටස දක්වා ගමන්කර ක්‍රියාකාරී වේ. ඔබට පවතින ගැටළුවේ ස්වභාවය අනුව සුදුසු පීලින් වර්ගය සහ ප්‍රතිකාර සිදු කිරීමට අවශ්‍ය වාර ගණන තීරණය වේ.

## (4) ඔබ මෙම ප්‍රතිකාරයට සුදුසු නොවන්නේ කුමන අවස්ථාවලදීද?

- ඔබේ සමෙහි බැක්ටීරියා, වෛරස්, දිලීර ආසාදන ඇති විට
- ඔබේ සෞඛ්‍ය තත්වය මොනයම් හෝ ආකාරයකින් පිරිහී ඇති විට
- ඔබේ වෛද්‍යවරයා විසින් භාවිතා කිරීමට බලාපොරොත්තු වන ද්‍රාවණයේ ඇති සංඝටක වලට කෙදිනකදී හෝ ආසාත්මිකතාවයක් දක්වා ඇති නම්
- හිරු එළියට ඔබේ සමේ සංවේදීතාව වැඩි කරන ඖෂධ වර්ග ලබා ගන්නේ නම්
- ඔබට හර්පීස් සිම්ප්ලෙක්ස් (Herpes Simplex) වෛරස් ආසාදනය නිසා මුඛයේ, තොල් හෝ මුහුණේ තුවාල සෑදී ඇත්නම් (මෙය වෛද්‍යවරයාට පැවසිය යුතුයි. එවිට වෛද්‍යවරයා විසින් පීලින් ප්‍රතිකාරයට පෙර අවශ්‍ය ඖෂධ ප්‍රතිකාරයන් ඔබට ලබාදෙනු ඇත.)

## (5) මෙම ප්‍රතිකාරයට සම සූදානම් කරන්නේ කෙසේද?

මෙහිදී ඔබගේ වෛද්‍යවරයා හිරු එළියෙන් සම ආරක්ෂා කිරීමේ ප්‍රතිකාරක, පීලින් ප්‍රතිකාරයට සති කිහිපයකට පෙර ලබා දෙනු ඇත.

## (6) මෙම ප්‍රතිකාරයේ අතුරු ආබාධ මොනවාද? මෙය ආරක්ෂාකාරී ප්‍රතිකාරයක්ද?

ඕනෑම ප්‍රතිකාරයක සුළුවෙන් හෝ අතුරු ආබාධ ඇත. පීලින් ප්‍රතිකාරයේ ද අතුරු ආබාධ කිහිපයක් හඳුනාගෙන ඇති අතර, ප්‍රතිකාර කිරීමට පෙර ඔබගේ වෛද්‍යවරයා විසින් මේ සම්බන්ධයෙන් දැනුවත් කරනු ඇත. පහතින් ඇත්තේ එවැනි අතුරු ආබාධ කිහිපයකි.

- සම රතු පැහැ ගැන්වීම
- සමෙහි සියුම් වේදනාවක් ඇතිවීම
- ප්‍රතිකාරයට වහාම පසු සමෙහි තද ස්වභාවයක් ඇතිවීම හා සම වියළීම
- කැසීම
- සම ගැලවී යාම

මේ සියලු අතුරු ආබාධ තාවකාලික වන අතර ඉතා ඉක්මනින් මෙම අතුරු ආබාධ සමනය වී ඔබේ සම යථා තත්ත්වයට පත් වේ.

## (7) මෙම ප්‍රතිකාරයේ සංකූලතා මොනවාද?

ශ්‍රී ලංකාවේ දැනට වෛද්‍යවරුන් විසින් කරනු ලබන්නේ මතුපිට පීලින් ප්‍රතිකාරය (superficial peeling) වන අතර එහි සංකූලතා ඇතිවීම සුලභ නොවේ.

නමුත් ඉතා කලාතුරකින්

- සම කළු පැහැ ගැන්වීම
- කැළැලි ඇතිවීම සිදුවිය හැක

## (8) පීලින් ප්‍රතිකාරය නිවසේදී / රූපලාවණ්‍යාගාරවලදී සිදු කිරීම යෝග්‍ය ද?

- නිවැරදි අම්ල නිවැරදි සාන්ද්‍රණයෙන් භාවිතා නොකිරීම, සම නිවැරදිව පෙරසූදානමක් නොකිරීම මගින් සාර්ථක ප්‍රතිලාභ ලබාගත නොහැකි අතර එය දරුණු සංකූලතා ඇති කිරීමටද හේතුවේ. මෙහිදී කළු වීම, ස්ථිර කැළැලි ඇතිවීම, පිළිස්සීම සිදුවිය හැක.

- එම නිසා මෙම ප්‍රතිකාර කිසිවිටෙකත් ඔබ නිවසේ දී සිදු නොකළ යුතු අතර මේ පිළිබඳ මනා අවබෝධයක්, දැනුමක් හා පුහුණුවක් ඇති චර්ම රෝග විශේෂඥ වෛද්‍යවරයකු හෝ එවැනි වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කිරීම අනුමත කෙරේ.

## (9) ප්‍රතිකාරයට පසු ඔබ කළ යුතු / නොකළ යුතු දේ මොනවාද?

- හිරු එළියට නිරාවරණය වීම අවම කළ යුතු අතර, ඔබ හිරු එළියට නිරාවරණය වන සෑම විටකදීම, විනාඩි 20 කට පෙර හිරුඑළියෙන් ආරක්ෂා වීමේ ආලේපන (Sunscreen) ආලේප කළ යුතුය.

- ප්‍රතිකාරයෙන් පසු වාෂ්ප ප්‍රතිකාර, Scrubbing හා facial කිරීම වෛද්‍ය අවවාද ලබා ගැනීමෙන් පසුව සිදු කළ යුතුය.

- වෛද්‍යවරයා විසින් නියම කරන සමට තෙතමනය ලබා දෙන ආලේපන (moisturizing cream) භාවිතා කළ යුතුය.

- ප්‍රතිකාරයට භාජනය වූ ඔබගේ සමෙහි ඉදිමීමක්, වේදනාවක්, රතු පැහැ ගැන්වීමක්, කහ පැහැති කබොල් සෑදීමක් ඇතිනම් වහාම වෛද්‍යවරයා හමු විය යුතුය.